14345

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

06 ශ්‍රේණිය

ගණිතය

නම / විභාග අංකය :- .... කාලය : පැය 02යි.

I කොටස

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගිනි)**

(1)  අඳුරු නොකරන ලද කොටස මුලු රූපයෙන් භාගයක් ලෙස ලියන්න.

....

(2) $\frac{1}{12}$ හා $\frac{1}{3}$ අතරින් වඩා විශාල භාගය කුමක් ද? ....

(3) 5 හි සාධක 02 ක් ලියන්න. ....

(4) 20 ක් 30 ත් අතර වූ 7 හි ගුණාකාර 2 ක් ලියන්න.

....................................., ...

(5) 32 □ යන සංඛ්‍යාව 2 න් ඉතිරි නැතිව බෙදීමට 6 ට වැඩි හිස් කොටුවට යෙදිය හැකි ඉලක්කමක් ලියන්න.

....

(6) පහත රූප අතරින් සරල රේඛීය සංවෘත තල රූපය තෝරා යටින් ඉරක් අඳින්න.



(i) (ii) (iii) (iv)

(7) 1 ට $\frac{1}{10}$ ඒවා කීය ද? ....

(8) 0.45 හි 4 ඉලක්කමට හිමි ස්ථානීය අගය කවරේ ද? ....

(9) $\frac{28}{100}$ දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න. ....

(10) 0.3 .... 0.32 හි හිස්තැනට සුදුසු < හෝ > ලකුණ යොදන්න.

(11) 1 සිට 5 තෙක් ඇති ඉලක්කම් වල එකතුව කීය ද? ....

එය කීවන ත්‍රිකෝණ සංඛ්‍යාව ද? ....

(12) පහත ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.

(a) 1 ප්‍රථමක සංඛ්‍යාවකි. ☐

(b) සියලු සමචතුරස්‍ර සංඛ්‍යා සංයුක්ත සංඛ්‍යා වේ. ☐

(13) පහත හිස්තැන්වලට සුදුසු අගය යොදන්න.

(i) .... mm = 1cm (ii) .... m = 1km

(14) 

පාද 6 ම සමාන වන මෙම රූපයේ පරිමිතිය 30cm කි.
පාදයක දිග සොයන්න.

....

(15) 18, ප්‍රථමක සාධක වල ගුණිතයක් ලෙස දක්වන්න.

....

....

(16) 52 ආසන්න 10 ට වටයන්න. ....

(17) 1 ත් 10 ත් අතර ඇති ප්‍රථමක සංඛ්‍යා සියල්ල ම ලියන්න.

....

(18) 

....

ඉහත දක්වා ඇති රටාවේ ඊළඟ රටාව ඇඳ දක්වන්න.

(19) 24, 8 හි ගුණාකාරයකි. ඊළඟ 8 හි ගුණාකාරය කුමක් ද? ....

(20) 2, 3, 4 යන සංඛ්‍යා 3 හි ම ගුණාකාරයක් වන කුඩාම සංඛ්‍යාව ලියන්න.

....

II කොටස
ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.

(1) (a) බඳුනක එකම වර්ගයේ රතු පාට බොත්තම් 5 ක් හා නිල් පාට බොත්තම් 4 ක් ඇත.

(i) බඳුනේ ඇති රතු පාට බොත්තම් ප්‍රමාණය මුලු බොත්තම් ප්‍රමාණයේ භාගයක් ලෙස ලියන්න. (ල. 01)

....

(ii) ඉහත ඔබ ලියූ භාගයට තුල්‍ය වූ ලවය 10 වූ භාගය ලියන්න. (ල. 01)

....

(b) <, >, = සංකේත වලින් ගැලපෙන සංකේතය යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.

(i) $\frac{5}{12}$ .... $\frac{11}{12}$ (ල. 01)

(ii) $\frac{3}{8}$ .... $\frac{5}{16}$ (ල. 01)

(c) අගය සොයන්න.

(i) $\frac{3}{7} + \frac{2}{7} =$ .... (ල. 01)

(ii) $\frac{8}{12} - \frac{2}{12} =$ .... (ල. 01)

(iii) $\frac{2}{3} + \frac{1}{6} =$ ....

.... (ල. 02)

(iv) $\frac{15}{21} - \frac{2}{3} =$ ....

.... (ල. 02)

(d) 45321687 යන සංඛ්‍යාව,

(i) සම්මත ආකාරයෙන් ලියන්න. ....(ල. 01)

(ii) කියවන ආකාරය වචනයෙන් ලියන්න.

.... (ල. 01)

---

(2) (a) පහත රූපයේ A, B,C, D, E, F ලක්ෂ්‍ය පිහිටි ස්ථාන අනුව පහත වගුව සම්පූර්ණ කරන්න.



	පිහිටි ස්ථාන	ලක්ෂ්‍යය
(i)	වෘත්තය මත	A..............., ...
(ii)	වෘත්තය තුළ	..............., ...
(iii)	වෘත්තය පිටත	F..............., ...

(ල. 02)

(b) පහත හිස්තැන් සඳහා සුදුසු අගයන් යොදන්න.

(i) 70 mm = ... cm

(ii) 8 cm 4 mm = ... mm

(iii) 675 m = ... cm

(iv) 125 cm = ... m

(v) 20375 m = ... km (ල. 05)

(c) සුදුසු පරිදි යා කරන්න.

(i)	තත්පර 115	A.	මිනිත්තු 120
(ii)	මිනිත්තු 45	B.	දින 3
(iii)	පැය 2	C.	මිනිත්තු 1 තත්පර 55
(iv)	දින 2	D.	තත්පර 2700
(v)	පැය 72	E.	පැය 48

(ල. 05)

(3) (a) (i) පහත සංවෘත රූපයේ දැක්වෙන ඒවා සුදුසු පරිදි ගොඩවල් දෙකකට වෙන් කරන්න. (ල. 04)

(ii) වෙන් කරන ලද ගොඩවල් දෙකට සුදුසු නමක් තිත් ඉරිමත ලියන්න (ල. 02)



....

(b) සමතලා බිමක පිහිටි ස්ථාන කිහිපයක කොටු ජාලයක් දක්වේ.
A මගින් දක්වෙනුයේ පියල්ගේ නිවස ය. පියල් නිවසේ සිට ඊතලවලින් දක්වා ඇති මාර්ගය ඔස්සේ ඇවිද ගොස් නැවත නිවසට පැමිණේ. ඔහු ගමන් කළ දිශා ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.



ගමන් මඟ	ගමන් කළ දිශාව
A සිට B දක්වා	උතුර
B සිට C දක්වා	....
C සිට D දක්වා	....
D සිට E දක්වා	....
E සට A දක්වා	....

ලකුණු 01 බැගින්

(c) හිස්තැනට සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

(i) තලයක් තිරස් බව දැන ගැනීමට .... භාවිතා කරයි.

(ii) සිරස් පිහිටීම් හඳුනා ගැනීමට .... භාවිතා කරයි.

(4) පහත තල රූප සුදුසු පරිදි වගුගත කිරීම සඳහා අදාළ අක්ෂරය අදාළ තීරයට යොදන්න.



(a) (b) (c) (d) (e)



(f) (g) (h)

සංවෘත සරල රේඛීය තල රූප	විවෘත සරල රේඛීය තල රූප	සංවෘත වක්‍ර රේඛීය තල රූප	විවෘත වක්‍ර රේඛීය තල රූප

(ලකුණු 08)

(b) පහත රූප සටහනේ දැක්වෙන කෝණ වර්ග නම් කරන්න.



a - ....

b - ....

c - ....

d - .... (ල. 04)

(5) (a) පහත දැක්වෙන එක් එක් භාගය දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.

(i) $\frac{6}{10}$ = ... (ii) $\frac{35}{100}$ = ... (ල. 02)

(b) පහත සංඛ්‍යා ආරෝහණ පටිපාටියට ලියන්න.

0.2, 0.5, 0.25, 1.35 .... (ල. 02)

(c) අගය සොයන්න.

(i)

$$\begin{array}{r} 0.76 \\ +\,0.03 \\ \hline \\ \hline \end{array}$$

(ii)

$$\begin{array}{r} 3.61 \\ -\,1.63 \\ \hline \\ \hline \end{array}$$

(ල. 04)

(d) (i) පහත සංඛ්‍යා රේඛාව මත -4 හා 2 ලක්ෂ්‍ය ලකුණු කරන්න.



(ල. 02)

(ii) -4 හා 2 අතර පිහිටි සියලු ඍණ නිඛිල ආරෝහණ පටිපාටියට ලියන්න.

.... (ල. 02)

---

(6)

1	5	9	13	17	21	
2	6	10	14	18	22	25
3	7	11	15	19	23	
4	8	12	16	20	24	

(i) ඉහත රූපයේ දක්වා ඇති සංඛ්‍යා අතරින් 16 ත් 25 ත් අතර පිහිටි ඉරට්ට සංඛ්‍යා ලියන්න.

.... (ල. 02)

(ii) 10 සිට 15 දක්වා ඇති ඔත්තේ සංඛ්‍යා ලියන්න.

.... (ල. 02)

(iii) ඉහත රූපයේ දක්වා ඇති සංඛ්‍යා වලින් ප්‍රථමක සංඛ්‍යා 4 ක් ලියන්න.

.... (ල. 02)

(iv) ඉහත රූපයේ ඇති සංඛ්‍යා වලින් කුඩාතම ම සංයුක්ත සංඛ්‍යාව කුමක් ද?

.... (ල. 02)

(v) ඉහත රූපය තුළ ඇති ත්‍රිකෝණ සංඛ්‍යා 4 ක් ලියන්න.

.... (ල. 02)

(vi) අගය සොයන්න.

96 × 9 = ... (ල. 02)

(7) (a) 32.451 යන සංඛ්‍යාවේ,

(i) 5 ඉලක්කමෙන් නිරූපිත ස්ථානීය අගය ලියන්න.

.... (ල. 02)

(ii) ඉහත දක්වා ඇති සංඛ්‍යාව ගණක රාමුවක නිරූපනය කරන්න. (ල. 02)

(b) (i)



මෙම රූපයේ පරිමිතිය සොයන්න. (ල. 02)

(ii) තේ කොළ අසුරා ඇති පෙට්ටියක මුළු ස්කන්ධය 8kg 250g කි. පෙට්ටියේ ඇති තේ කොළ වල ස්කන්ධය 7kg 300g කි. පෙට්ටියේ ස්කන්ධය සොයන්න. (ල. 02)

(c)



ඉහත දක්වා ඇති රූප නිරීක්ෂණය කර අංකය හිමි රූපයේ නම ලියන්න.

රූපයට හිමි අංකය	නම
1	....
2	....
3	....
4	....

(ල. 04)

Answer

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

06 ශ්‍රේණිය

ගණිතය - පිළිතුරු පත්‍රය

I කොටස

(1) $\frac{4}{16}=\frac{1}{4}$

(2) $\frac{1}{3}$

(3) 1, 5

(4) 21, 28

(5) 8

(6) 1

(7) 10

(8) $\frac{1}{10}$

(9) 0.28

(10) 0.3 < 0.32

(11) 1 + 2 + 3 + 4 + 5
15
5 වන

(12) (a) ✗
(b) ✗

(13) 10mm = 1cm
1000 m = 1km

(14) $\frac{30}{6} = 5cm$

(15) $18 = 2 \times 3 \times 3$

(16) 50

(17) 2, 3, 5, 7

(18)
o o o o
o o o o
o o o o
o o o o

(19) 32

(20) 12

II කොටස

(1) (a) (i) $\frac{5}{9}$ ....(ල. 01)
(ii) $\frac{5}{9}=\frac{10}{18}$ .... (ල. 01)

(b) (i) < (ල. 01)
(ii) > (ල. 01)

(c) (i) $\frac{5}{7}$ (ල. 01)
(ii) $\frac{10}{12}$ හෝ $\frac{5}{6}$ (ල. 01)
(iii) $\frac{4}{6}+\frac{1}{6}=\frac{5}{6}$ (ල. 02)
(iv) $\frac{15}{21}-\frac{14}{21}=\frac{1}{21}$ (ල. 02)

(d) (i) 45 321 687
(ii) හතලිස් පස් මිලියන තුන්සිය විසි එක් දහස් හයසිය අසූ හත (ල. 02)

(2) (a) (i) Ⓐ D
(ii) B, C
(iii) E, Ⓕ (ල. 02)

(b) (i) 7cm
(ii) 84mm
(iii) 67500cm
(iv) 1.25 m
(v 20.375 km (ල. 01 බැගින්)

(c) (i) — C
(ii) — D
(iii) — A
(iv) — E
(v) — B
(ල. 05)

(3) (a) (i)
උතුර, දකුණ, නැගෙනහිර, බටහිර (ල. 02)
ප්‍රධාන දිශා (ල. 01)

නිරිත, ඊසාන, ගිණිකොණ, වයඹ (ල. 02)
අනු දිශා (ල. 01)

(b) B සිට C → නැගෙනහිර
C සිට D → ඊසාන
D සිට E → ගිනිකොණ
E සිට A → නිරිත (ල. 01 බැගින්)

Answer

(c) (i) ස්ප්‍රිතු ලෙවලය
(ii) ලම්බය (ල. 01)

(4) (a) නිවැරදි පිළිතුරකට ල. 01 බැගින්
(සුදුසු පරිදි වගුවේ අංක දැමීම)

(b) a - සරල කෝණය
b - පරාවර්ත කෝණය
c - සුළු කෝණය
d - මහා කෝණය (ල. 01 බැගින්)

(5) (a) (i) 0.6
(ii) 0.35 (ල. 01 බැගින්)

(b) 0.2, 0.25, 0.5, 1.35

(c) (i) 0.79
(ii) 1.98

(d) (i) රූප සටහනේ ලක්ෂ්‍ය ලකුණු කිරීම
(ල. 01 බැගින්)
(ii) -3, -2, -1 (ල. 02)

(6) (i) 18, 20, 22, 24 (ල. 02)
(ii) 11, 13, 15, 17, 19 (ල. 02)
(iii) ඕනෑම ප්‍රථමක සංඛ්‍යා 4 ක් (ල. 02)
(iv) 4
(v) 1, 3, 6, 10, 15 යන ඒවායින්
ඕනෑම 4ක් (ල. 02)
(vi) $96 \times 9 = 864$ (ල. 02)

(7) (a) (i) $\frac{1}{100}$
(ii) නිවැරදි රූපයට (ල. 02)

(b) (i) 12.2cm
(ii)

kg	g
8	250
-7	300
0	950

950g (ල. 02)

(c) 1 - සමචතුරස්‍රය
2 - ත්‍රපීසියම
3 - සමාන්තරාස්‍ර
4. රොම්බසය
(ල. 01 බැගින් = ල. 04)